**ශීර්ෂය 326 - ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය.**

**-----------------------------------------------------------------------------------------------------------**

ශීර්ෂය 326 - ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 ජුනි 09 දින දෙපාර්තමේන්තුවේ කොමසාරිස්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

**-----------------------------------------------------------------------------------------------**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**-------**

**2.1 විසර්ජන ගිණුම**

**----------------**

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

**---------------------------**

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 233.80 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 226.60 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 7.20 ක් හෙවත් සියයට 3.08 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 221.51 | 214.70 | 6.81 | 3.07 |
| මූලධන | 12.29 | 11.90 | 0.39 | 3.17 |
| **එකතුව** | **233.80** | **226.60** | **7.20** | **3.08** |

**2.2 අත්තිකාරම් ගිණුම**

**2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 32601 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම |  | ලැබීම් |  | හර ශේෂය |  |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 10.18 | 10.17 | 5.78 | 7.01 | 40.00 | 21.86 |

**2.3 අග්‍රිම ගිණුම**

දෙපාර්තමේන්තුව යටතේ වූ අග්‍රිම ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.473,434 ක් විය.

**2.4 පොදු තැන්පත් ගිණුම**

දෙපාර්තමේන්තුව යටතේ වන පොදු තැන්පත් ගිණුමෙහි 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.64,483 ක් විය.

**2.5 විගණන නිරීක්ෂණය**

ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|---|
| | ------------------ | ------------------- | ------------- |
| (i) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය. | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය. | පවත්වා නොතිබුණි. |
| (ii) | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය. | මුදල් රෙගුලාසි 451 | පවත්වා නොතිබුණි. |
| (iii) | උප පත්‍රිකා පොත් ලේඛනය | මුදල් රෙගුලාසි 341 | පවත්වා නොතිබුණි. |
| (iv) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලීන කර නොතිබුණි |

**3.2 විසර්ජන ගිණුම**

------------------

**අයවැය විචලනය**

--------------------

මූලධන වැය විෂයයක හා පුනරාවර්තන වැය විෂයයන් 04ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා උපයෝජනයන් කළ පසු ඉතිරිය එම වැය විෂයයන්ගේ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 20 ක සිට සියයට 100 ක් දක්වා වූ පරාසයක ප්‍රමාණයන්ගෙන් ඉතිරිවීම් සිදු වී තිබුණි.

**3.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

--------------------------------------------------------------------

විෂය අංක 32601 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.270,661 ක් වූ අතර එම ශේෂ වර්ෂ 1 ක සිට වර්ෂ 5 ක් දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණත්, එම හිඟ හිටි ණය ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

**3.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

-----------------------------------------

**3.4.1 අභ්‍යන්තර විගණනය**

------------------------

අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි.

**3.4.2 විගණන හා කළමනාකරණ කමිටුව**

--------------------------------------

විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් සමාලෝචිත වර්ෂයේදී පවත්වා නොතිබුණි.

**3.5 වත්කම් කළමනාකරණය**

---------------------------

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2015 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2016 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් 2016 මැයි 31 දින වන විටත් එම වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. අවසාන වශයෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2014 වර්ෂය වෙනුවෙන් පවත්වා තිබුණි.

(ආ) **පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම**

කුරුණෑගල තෙලියාගොන්න බෞද්ධ විහාරස්ථාන භූමියේ ප්‍රජා විශෝධන මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා රු 331,575 ක් වැය කර තිබුණි. මෙම ඉදිකිරීම සිදු කළ පර්චස් 12 ක් වූ බිම් කොටස රජයට අත්පත් කරගෙන නොතිබුණි. එමෙන්ම එම ඉදිකිරීම සඳහා සුදුසු ස්ථානීය පරීක්ෂාවක්ද සිදු කර නොතිබුණි.

**(ඇ) බේරුම් නොකළ බැරකම්**

දෙපාර්තමේන්තුව විසින් 2015 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම්වල වටිනාකම රු.590,207 ක් වී තිබුණි. එම බැරකම් නිරවුල් කිරීමේදී රු.35,972 ක වැඩිපුර ගෙවීමක්ද සිදු කර තිබුණි.

## 3.6 අනුකූල නොවීම්

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | |
| (i) මුදල් රෙගුලාසි 371(2) (ඇ) | 474,563 | විවිධ කාර්යයන් සඳහා නිකුත් කර තිබුණු තත් කාර්ය අතුරු අග්‍රිම අදාළ කාර්ය නිමවූ වහාම නිරවුල් කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 371(2) (ඇ) | 478,325 | අවස්ථා 38 කදී මාණ්ඩලික නොවන නිලධාරීන් වෙත තත් කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි. |

**3.7** කාර්යසාධනය

-----------------

2015 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්.

-----------------------------------------------------

2015 වර්ෂය සඳහා ප්‍රජා විශෝධන ආඥා ප්‍රමාණය වැඩි කර ගැනීමේ වැඩසටහන සඳහා රු.800,000 ක ප්‍රතිපාදන සලසා තිබුණි. එම ප්‍රතිපාදනයෙන් රු.138,813 ක් පමණක් වැය කර තිබුණි. ඒ අනුව අදාළ කාර්ය ප්‍රාදේශීය කාර්යාල 97 ක ක්‍රියාත්මක කළ යුතුව තිබුණත්, එය කාර්යාල 29 ක පමණක් ක්‍රියාත්මක කර තිබුණි.

**(ආ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව ක්‍රියා නොකිරීම**

**-----------------------------------------------------**

කාර්යාල ක්‍රම වැඩිදියුණු කිරීම යටතේ පරිගණක ජාලගත කිරීම සඳහා රු.800,000 ක් ඇස්තමේන්තු කර තිබුණද, එම ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබුණි.

**3.8** බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු

----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) බැංකු සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීමේ ප්‍රමාදයන්**

**-----------------------------------------------------**

දෙපාර්තමේන්තුව විසින් මහජන බැංකුවේ විවෘත කර තිබුණු බැංකු ජංගම ගිණුමකට අදාළව 2015 දෙසැම්බර් මාසය සඳහා වූ බැංකු සැසඳුම් ප්‍රකාශය මාස 03 කට අධික කාලයක ප්‍රමාදයකින් පසුව 2016 අප්‍රේල් 04 දින පිළියෙල කර තිබුණි.

**(ආ) ගැලපුම් කළයුතු ශේෂ**

**---------------------------**

දෙපාර්තමේන්තුව විසින් 2015 දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශනයේ මාස 06 කට වැඩි වර්ෂ 01 ක් දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණු රු.3,389,503 ක හඳුනා නොගත් බැංකු ගිණුමට බැර වී තිබුණු තැන්පතු හා එකතුව රු.50,181 ක බැංකුව විසින් කර තිබුණු ගෙවීම්ද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් දෙපාර්තමේන්තුවේ පොත්වල ගිණුම්ගත කර නොතිබුණි.

**(ඇ) කල් ඉකුත්වූ චෙක්පත්**

**--------------------------**

දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර තිබුණත්, ගෙවීම් සඳහා බැංකුව වෙත ඉදිරිපත් නොවූ කල් ඉකුත් වූ එකතුව රු.21,110 ක් වටිනා චෙක්පත් 03 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඈ) තැන්පත් කල නමුත් උපලබ්ධි නොවූ තැන්පත්

---------------------------------------------------

දෙපාර්තමේන්තුව විසින් මාසය 6 කට පෙර එකතුව රු.5,770 ක් වටිනා චෙක්පත් 04 ක් බැංකුවේ තැන්පත් කර තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් උපලබ්ධි වී නොතිබුණි.

**3.9 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 04 | 02 | 02 |
| (ii) | තෘතියික මට්ටම | 124 | 114 | 10 |
| (iii) | ද්විතියික මට්ටම | 468 | 387 | 81 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 11 | 09 | 02 |
| | **එකතුව** | **607** | **512** | **95** |